වින්ඩෝ මොප් කිරීම

හේමමාලා හේරත්

අප නිවසෙහි සිටින්නේ, මාත් මගේ සැමියාත් පමණෙකි. එහෙත් අප නිවස ඉක්මණින් දුහුවිල්ලෙන් පිරි, අවුල් වන්නේ ගෙතුලට හමා එන තද සුළං නිසාය. කවුළු ඇර, හිරු එළිය පවතින වෙලාවල පහත් මේස, හා අහුමුළු සියල්ලෙහිම ඇති දූවිලි මනාව පෙනෙන්නේය. දූවිලිවලට මාව පෙන්නන්ට බැරිය. මටත් දූවිලි එසේමය. දූවිලි ගොඩක සිටිනාවිට මගේ නහය දැවෙන්නට පටන්ගනී. කිවිසුම් යයි. ඊළඟට දැනෙන්නේ දැඩි වෙහෙස ගතියකි. ඕස්ට්‍රේලියාවේ මෙන් නොව මෙහි මුළුතැන්ගෙය, නාන කාමර ඉක්මණින් ශුද්ධ පවිත්‍ර කළ යුතුය. ඒ සඳහා විදේශ ආධාර (මැලේසියානු) ගැනීමට තීරණය කළේ, තනිවම එය කරගැනීමට නොහැකි-ම නිසාය.

අප වාසය කළ කොන්ඩෝවේ පහත මාලයේ උන් කාන්තාවක් මේ ආධාර සැපයීමේ කටයුතු කළාය. ඇය වෙත ගොස් නිවස පිරිසිඳු කිරීම සඳහා සහාය අවශ්‍ය බව පැවසුවෙමි.

බොස්ට කතා කරනා බවට පොරොන්දු වූ ඇය මාගේ මොබයිල් නම්බරය ඉල්වා ගත්තාය.

ආපසු නිවසට පැමිණි විගසින්, මාගේ මොබයිලය නාදවිණි. නාඳුනන නොම්මරයකි.

"හෙලෝ !" මම පැවසීම්

"Want to Clean House ?" එහා පසින් ඇසිණි.

"I Come now ?"

"Okay" මම එකඟ වූයෙමි.

"බොස්" විනාඩි දහයකින් පමණ ආවාය. වඩා උස්, මහත් නොවූ, ඉතා කෙටි කලිසමකින් සැරසුනු, කෙස් කළඹ රබර් පටියකින් තදට බැඳ සිටි ඇය චීන ජාතික කාන්තාවක් වූවාය. අපි දෙදෙනා දන්නා ඉංග්‍රීසියෙන් කළ යුතු වැඩත්, ඒ සඳහා අයකළ මුදලත් පිළිබඳව කතා කළෙමු.

"You Want clean outside" ඈ ඇසුවාය. මම නිවසෙහි ඉදිරි දොර දෙස බැලුවෙමි. ඇතුල්වන ප්‍රධාන දොර ඉදිරියෙන් වූයේ පාවහන් ගලවා තැබීම සඳහා වූ කොටසකි.
ඉන් එහාට, ඉබ්බකු දැමූ ගරාදි ආකාරයට තනන ලද ශක්තිමත් දොරක් විය.

"Outside" මම එයම ප්‍රතිරාවය කළෙමි.

"Yes" 'බොස්' හිස වැනුවාය.

"කොහෙද මෙයා මේ Outside කියන්නේ ? " මම කල්පනා කළෙමි.

මා කල්පනා කරනු දුටු 'බොස්' ද මඳක් කල්පනා කළාය. "Outside" ඈ යළිදු කීවාය. එහෙත් මගේ ටියුබ් ලයිට් මොළයට ඇය කීමට තනන දේ නොවැටහිණි. ඉන්පසු ඇය කළේ දොරවෙත ගොස් එය අතින් අතුල්ලා පෙන්නීමයි. ඈ එයට ශීතකරණ, කබඩ් යනාදියේ දොරවල්වලද අනුකරණය කර පෙන්වූවාය.

"Oh …Outside" මම පැවසුවෙමි. "Okay Okay…"

"Mop windows" ඇගේ ඊළඟ ප්‍රශ්ණය විය.

"Mop windows" මම ඇසීමි.

"how do you mop windows"

මම මගෙන්ම අසාගතිමි. දිග මොප් එකකින් බැල්කනියේ දොර ජනෙල් මදිනා ඇගේ රු වමට පෙනී ගියේය.

"Mop……. Mop " ඈ යළිදු පැවසුවාය.

"you mean clean windows ?"

"Clean……." මම කීවෙමි.

ඈ සිනහවකින් හිස වැනුවාය.

"mop…….. Yes……."

යාන්තම් කළ යුතු වැඩ කතා කර අහවර කර ගතිමු. ගෙවිය යුතු ගණන ඉක්මණින් කරගත හැකි වූයේ ඇගේ ගණිතය, මගේ ගණිතයට වඩා හොඳ වූ නිසාය. සිකුරාදා උදෑසන ඒමට ඇය පොරොන්දු වූවාය.

"8.30 you have to be here on time please" මම පැවසුවෙමි.

පසුදා උදෑසන අවදිවන විට පෙරදා රාත්‍රී 11.00 ට ඇගෙන් ඇමතුමක් ලැබී තිබෙනු දුටුවෙමි.

කලබල වූ මා ඇය ඇමතුවේ, ප්‍රශ්නය කුමක්දැයි දැනගැනීම සඳහාය.

"did you ring me last night ? " මම ඇසුවෙමි.

"yes. We come Friday" අනෙක් පසින් ඈ ඇසුවාය.

"yes. 8.30 please be on time."

සියල්ල කතාකරගත් පසුද, මහරෑ ඇය කතා කළේ ඇයි දැයි සිතමින් ෆෝනය විසන්ධි කළෙමි.

සිකුරාදා උදෑසවන විටද, ඇය එතැයි යන හැඟීමක් මගේ සිතෙහි නොවීය. එහෙත් එදින හරියටම උදේ අටහමාර වෙද්දී නිවසේ, විදුලි සීනුව හඬ උණේය. අදහාගත නොහැකි දර්ශනයකි. සිනහවක්ද මුවගට නැගුණේය. විවිධ වයසේ තරුණ, මැදිවිය, උස, මහත, කොට, ගැහැනු පස් දෙනෙක් මොප්, බකට්, ඉණිමගක්, ශුද්ධ කිරීම සඳහා පාවිච්චි කරනා බෙහෙත් වර්ග සහිත බේසමක් හා කුඩා ස්ටූල කිහිපයක් අතැතිව පොඩිපහේ යුද්ධයකට මෙන් සැරසී දොර අසල සිටගෙන උන්නාහ.

■

දේවක සිතාර ජයසූරිය

1956 දී සිදු වූ දේශපාලන පෙරැළිය බරපතළ ලෙස සාර්ථක වීමට ඉවහල් වූ ප්‍රධානම සාධකය වූයේ ශ්‍රීමත් ජෝන් කොතලාවල අගැමැති වීමය. ඔහු කොපමණ ඉංග්‍රීසිවාදී වූයේ ද යත් ඔහු එංගලන්තයේ වංශාධිපතීන් අතර ජනප්‍රිය විනෝදාංශයක් වූ නරි දඩයමේ යාම එනම්, අශ්වයින් පිට නැගී දඩ බල්ලන්ද සමඟ දඩයක්කාර පිරිසක් විනෝද ගමනක ස්වරූපයෙන් දඩයමේ යන අතර නරියෙකු වට කොට මරා දැමීමකට ද සහභාගි විය. ඒ පමණක් නොව එළවස්සෙකුට බඩපුරා කිරි බොන්නට හැර එවේලේම මරා පුළුස්සා (බාබකිව් කොට) උගේ බඩ පලා බොක්කේ කැටි ගැසුණු කිරි සමග උගේ මස් බෙදා ගෙන කෑමකට ද ප්‍රසිද්ධියේම සහභාගි විය.

භාෂා ප්‍රශ්නයේ ඉතිහාසයෙන්.....

56 මහ මැතිවරණයට එක්සත් භික්ෂු පෙරමුණේ භික්ෂුවක් විසින් පිළියෙළ කරනු ලැබූ 'මාර යුද්ධය' නම් කාටූනයට මෙම එළවස්සාගේ රුවද ඇතුළත්ව තිබුණි. ජෝන් කොතලාවල කාන්තාවන් ප්‍රසිද්ධියේ සිප වැළඳ ගත්තේය. සෑම සෙනසුරාදාවකම කඳවල වලව්වේ බාල් නැටුමක් පැවතුණි. එවකට පුවත්පත්වල වර්ණවත්ව ඡායාරූපද සමඟ පළ විය. එය බෞද්ධ ජයන්තිය පැවැත්වීමට ඔන්න මෙන්න කියා තිබූ රටේ අගමැතිගේ ක්‍රියා කලාපය විය. එහෙයින් ශ්‍රී ලංකාවේ සිංහල බෞද්ධ මධ්‍යම පාන්තික උගතුන්ගේ පිළිකුළ හා වෛරය පුපුරා උතුරා දෝර ගලා ගියේය. බණ්ඩාරනායක ජයගත්තේය.

1955 ඔක්තොම්බර් මස 19 වෙනි දින 'සිංහල සහ දෙමළ යන භාෂා ද්විත්වයටම මුළු දිවයින පුරාම සමතැන් ලැබෙන පරිදි ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව සංශේධනය කළ යුතුය.' යන යෝජනාව රුවන්නවැල්ල ල.ස.ස.ප. මන්ත්‍රී ආචාර්ය ඇන්. ඇම්. පෙරේරා විසින් ගෙන එන ලදී. එය ස්ථිර කරන ලද්දේ දෙහිඕවිට සම සමාජ පාර්ලිමේන්තු මන්ත්‍රී එඩ්මන් සමරක්කොඩි විසින් ය. ආචාර්ය ඇන්. ඇම්. එම විවාද-යට සහභාගි වෙමින් මෙසේ කීවේය.

ආචාර්ය ඇන්. ඇම්. පෙරේරා (පා.ම.)
"මම ගරු මන්තීවරුන්ට පෙන්වාදීමට වෑයම් කළේ සුළු ජාතික කොටස්වලට බහුතර ජනයා අතින් කිසිදු අතවරයක් වන්නේ නැතැයි කොපමණ කියා සිටියත් එය ප්‍රමාණවත් නොවන බවයි. අතීතයේ දී අපි හොඳින් ජීවත් වූයෙමු. ඉදිරියටත් අපි එලෙසම ක්‍රියා කරන්නෙමු. කිසිදු බියක් ඇති කරගන්නට එපා යැයි අද කියා සිටීම ප්‍රමාණවත් නොවේ. අද තත්වය ඊට වඩා ඔබ්බට ගොස් ඇත. ක්‍රමයෙන් වර්ධනය වන මේ බිය තුරන් කිරීමට අපි කිසියම් නිශ්චිත ක්‍රියාමාර්ගයක් ගත යුතුය. අපි එසේ නොකළහොත් සිංහල අන්තවාදීන්ට ඔවුන්ගේ විනාශකාරී පියවර ගැනීමට එයින් ඉඩ ලැබෙනු ඇත. මේ ප්‍රශ්නය ගැන නිවැරදි විසඳුමක් අති වුවහොත් මතුවටත් එය එක්සත් ලාංකික ජාතියක් පවත්වා ගෙන යාමට මහත් සේ ආධාර වන බව ප්‍රකාශ කරමි. නමුත් අපි වැරදි පියවරක් ගත හොත් භයානක තත්ත්වයක් ඇතිවිය හැකිය.

(1955/10/19 - හැන්සාඩ්)

1952 දී තෝරා පත්කර ගත් ශ්‍රී ලංකාවේ දෙවන පාර්ලිමේන්තුවේ නිල කාලය අවසන් වීමට තිබුණේ 1957 වර්ෂයේ දී ය. නමුත් මැතිවරණය නියමිත වකවානුවට අවුරුද්දකුත් මාස 4ක් කලින් පාර්ලිමේන්තුව විසුරුවා හරින ලද්දේ මෝරමින් පැවති භාෂා ප්‍රශ්නය නිසා පැන නැගුණ උණුසුමින් ප්‍රයෝජන ගැනීමට බලයේ සිටි එජාපය තීරණය කළ හෙයිනි. මේ සඳහා 1956 මැතිවරණයට කලින් තමන්ගේ කැළණිය සම්මේලනයේ දී මෙතෙක් සිංහල සහ දෙමළ රාජ්‍ය භාෂා විය යුතු යැයි මතය දැරූ එක්සත් ජාතික පක්ෂය 'සිංහල පමණක් ' රාජ්‍ය භාෂාව විය යුතු යැයි තීරණය කළාය. මෙයට පිළිතුරු ලෙස ශ්‍රීලනිප ප්‍රමුඛ මහජන එක්සත් පෙරමුණ පැය 24න් සිංහල භාෂාව රාජ්‍ය භාෂාව කරන බවට පොරොන්දු විය. මැතිවරණ ප්‍රතිඵලවලදී මහජන එක්සත් පෙරමුණ ආසන 51ක් දිනා ආණ්ඩුව පිහිටු වූ අතර එජාපයට විපක්ෂ නායක ධූරයවත් ලබා ගත නොහැකි ලෙස ආසන 8 ට බැස්සේ ය.

ලංකා සමසමාජ පක්ෂයේ නායක ආචාර්ය ඇන්. ඇම්. පෙරේරා සහ ඔහුගේ දෙවැනියා වූ ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා 1930 මුල් භාගයේ දී බ්‍රිතාන්‍ය සුපිරි විශ්ව විද්‍යාලවලින් උපාධිය ලබා ගත්හ. එවකට මෙබඳු උපාධි දිනාගත්තෝ ලංකාවේ බොහෝ දුලබ වූහ. තමන් 'රත්‍රං මොළකාරයන් ' බව ඔව්හු තම කථාවල සහතික කොට පැවසූහ. අවසානයේ දී එම කතා සමච්චලයට ලක්වූයේ 1972 ව්‍යවස්ථාව නිර්මාණය කිරීමෙන් පසුය. 1972 ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව කෙටුම්පත් කිරීමට ආචාර්ය කොල්වින්ට පැවරිණි. විශාලතම සුළු ජනකොටස වූ ලාංකීය ද්‍රවිඩ නායකයෝ නව ව්‍යවස්ථාව සමඟ කිසිදු සම්බන්ධයකට අකමැති වූහ. එය ක්‍රියාත්මක වීමත් සමඟ ම පෙඩරල් පක්ෂයේ නායක ඒ අමිර්තලිංගම් ප්‍රසිද්ධ දේශනයකදී කියා සිටියේ 'ද්‍රවිඩයන්ට ආයුධ අතට ගැනීමට සිදුවන දිනය ළඟාවන බවත්, විදේශ රටවල සමහර සංවිධාන සමඟ සුහද සම්බන්ධතා පවත්වා ගැනීමේ අවශ්‍යතාවක් ද මතු වී ඇති බවත් ය. 1972 ව්‍යවස්ථාව තුළින් 1955 ඇන්. ඇම්. ගේ සහ එඩ්මන්ගේ යෝජනා නොසළකා හැරීම ලංකා සමසමාජ පක්ෂයට ඉතිහාසයෙන් වැදුණු යෝධ කුළුගෙඩි පහරක් නොවන්නේද ?